2020 12. 02 අද පිටුව 10

# උද්ධමනය නොවැම්බරයේදී ඉහළට

## - ලොකු ළූණු, රතු ළූණු සහ අර්තාපල් මිල ගණන් ඉහළ යද්දී, නොවැම්බරයේ පලතුරු හා නැවුම් මත්ස්‍ය මිල ගණන් පහළ යයි

**ෂම්ල පෙරේරා**

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 ඔක්තෝබර් මාසයේ පැවති 4.0% සිට නොවැම්බර් මාසයේදී 4.1%ක් දක්වා සුළු වශයෙන් ඉහළ යෑමක් පෙන්නුම් කරයි.

ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්වල සිදුවූ ඉහළ යෑම මේ සඳහා හේතු වී ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙන පරිදි ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ඔක්තෝබර් මාසයේ පැවති 10.0% සිට නොවැම්බර් මාසයේදී 10.3%ක් දක්වාත්, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ඔක්තෝබර් මාසයේ පැවති 1.3% සිට නොවැම්බර් මාසයේදී 1.6%ක් දක්වාත් ඉහළ ගොස් තිබේ.

2020 නොවැම්බර් මාසයේදී ආහාර කාණ්ඩයෙහි ලොකු ළූණු, රතු ළූණු සහ අර්තාපල් මිල ගණන් ඉහළ ගිය අතර, පලතුරු හා නැවුම් මත්ස්‍ය මිල ගණන් පහළ යෑමක් වාර්තා විය. මේ අතර ප්‍රධාන වශයෙන් ප්‍රවාහන (බස් ගාස්තු) උප කාණ්ඩයෙහි දක්නට ලැබුණු මිල ඉහළ යෑම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් නොවැම්බර් මාසයේදී ඉහළ යෑමක් වාර්තා වූ බව මහ බැංකුව වැඩිදුරටත් පවසයි.